**ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**
---------------------------------------------------------------------------------------

ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 25 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්
---------

### 2.1 විසර්ජන ගිණුම
----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**
----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 120.79 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 119.24 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1.55 ක් හෙවත් සියයට 1.28 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු. මලියන | |
| පුනරාවර්තන | 110.29 | 109.12 | 1.17 | 1.06 |
| මූලධන | 10.50 | 10.12 | 0.38 | 3.62 |
| **එකතුව** | **120.79** | **119.24** | **1.55** | **1.28** |

2.2 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 29501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 4.00 | 4.00 | 2.00 | 4.14 | 20.00 | 11.85 |

## 2.3 විගණන නිරීක්ෂණය

වාණිජ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 7 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 සිට සියයට 42 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 29501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයෙහි පසුගිය වර්ෂයේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු.121,426 ක වෙනසක් පැවති අතර එම වෙනස සමාලෝචිත වර්ෂයේදී රු.416,550ක් දක්වා වැඩිවී තිබුණි. මෙයට හේතුව අනාවරණය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ ණය ශේෂයන් වැඩියෙන් සටහන් වී ඇති බවට හඳුනාගෙන එම ශේෂයන් සඳහා ගැලපීම් සිදුකිරීම නිසා කේවල ශේෂ ලේඛනයේ එකතුව තවදුරටත් අඩුවී තිබුණු අතර ඒ අනුව දෙපාර්තමේන්තු පොත් සමඟ වෙනස වැඩිවී තිබුණි. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව සෑම මසක් අවසානයේදීම පාලන ගිණුමේ ශේෂය සී.සී. 10 ලේඛනයේ ශේෂය සමග සැසඳීම් ප්‍රකාශයක් පිළියෙල නොකිරීම නිසා මෙවැනි තත්ත්වයක් උද්ගතවී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර, එම කටයුතු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයට පවරා තිබුණු නමුත්, එම ඒකකය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3.4 කාර්යසාධනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය පිළිබඳ තොරතුරු ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| කාර්යය | 2016 | 2015 | සමාලෝචිත වර්ෂයේ වැඩිවීම/ (අඩුවීම) | වැඩිවීම/(අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො.මිලියන | එ.ජ.ඩො.මිලියන | එ.ජ.ඩො.මිලියන | |
| අපනයන | 10,217 | 10,212 | 5 | 0.05 |
| ආනයන | 19,515 | 18,989 | 526 | 2.77 |
| සමස්ත වෙළඳාම | 29,732 | 29,201 | 531 | 1.82 |
| වෙළඳ ශේෂය | (9,298) | (8,777) | (521) | (5.94) |

ඉහත දත්ත අනුව 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනය හා සමස්ත ආනයනය 2015 වර්ෂය හා සැසදීමේදී, අපනයන වටිනාකම එ.ජ.ඩො.මිලියන 5 ක් හෙවත් සියයට 0.05 කින් පමණක් වැඩි වී තිබුණු අතර, ආනයන වියදමද එ.ජ.ඩො.මිලියන 526 කින් හෙවත් සියයට 2.77 කින් වැඩි වී තිබුණි. එම හේතුවෙන් වෙළඳ ශේෂයේ හිඟය එ.ජ.ඩො.මිලියන 9,298 ක් වී තිබුණි. එනම් 2015 වර්ෂයට වඩා වෙළඳ ශේෂයේ හිඟය එ.ජ.ඩො.මිලියන 521 කින් වැඩි වී තිබුණි. එසේ හෙයින් ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපොල පුළුල් කරගැනිම අඛන්ඩව සිදු කළ යුතු කර්තව්‍යයක් බැවින්, අපනයන ආදායම ඉදිරි වර්ෂ තුළ වර්ධනය කර ගැනීම සඳහා ද්විපාර්ශවික, කලාපීය හා බහුපාර්ශවික මට්ටම්වලින් විදේශ වෙළඳ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා, තවදුරටත් වාණිජ නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

(ආ) විදේශ වාණිජ නියෝජනය පිළිබඳව වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | 2016 | 2015 | සමාලෝචිත වර්ෂයේ වැඩිවීම / (අඩුවීම) | වැඩිවීම/ (අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ---------------- | ------- | ------- | ----------------- | -------------- |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා ශ්‍රී ලංකාව වෙත සත්කාරක රටෙහි සහභාගීත්වය | 485 | 247 | 238 | 96.36 |
| සත්කාරක රටවලදී ශ්‍රී ලංකා විශේෂි (තනි - රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම | 49 | 63 | (14) | (22.22) |
| ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීම | 770 | 575 | 195 | 33.91 |
| සත්කාරක රට වෙත සංචාරය කළ දූත පිරිස් | 1005 | 888 | 117 | 13.18 |
| සත්කාරක රට වෙත පුද්ගල සංචාරයන් | 224 | 141 | 83 | 58.87 |
| ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් | 253 | 153 | 100 | 65.36 |

ඉහත දත්ත අනුව සත්කාරක රටවලදී ශ්‍රී ලංකා විශේෂි (තනි - රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම පෙර වර්ෂයට වඩා වැඩසටහන් 14 කින් හෙවත් සියයට 22 ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි. එසේ හෙයින් ශ්‍රී ලංකාව තුළ දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කරගැනීම සඳහා වාණිජ නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීම මත ප්‍රචාරණ අවස්ථා හඳුන්වාදීමේ අවශ්‍යතාවය පැවතුණි.

(ඇ) නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂගේ ඉල්ලීම මත ගබඩාව භාර නිළධාරියෙකු විසින් ගබඩාවේ ඇති මුද්‍රිත සහතිකපත් තොග, තොග ලේඛනයක සටහන් කර ප්‍රතිපත්ති අංශයේ නිලධාරියෙකුගෙන් අත්සන් ලබා ගැනීමෙන් අනතුරුව එම අංශය වෙත නිකුත් කරනු ලබයි. ගබඩාව මඟින් නිකුත්

කරනු ලබන හිස් සහතික පත් තොගය අත්සන් කර භාරගනු ලබන්නේ කාර්යාල කාර්ය සහායකු විසින් වන අතර සහතික පත් තොගයේ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් එක් එක් කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබූ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

## 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

අපනයනකරු වෙත නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික පත්වල දෙපාර්තමේන්තුවේ පිටපත දෙපාර්තමේන්තු පරිශ්‍රයේ තැනින් තැන අවිධිමත් ලෙස ගොඩගසා තිබූ අතර මේ හේතුවෙන් එම පිටපත්වල ආරක්ෂාවට හා ආයතනයේ ආකර්ශනීය පෙනුමට දැඩි හානියක් වී තිබුණි. තවද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මානසික ඒකාග්‍රතාවයකින් රාජකාරී කරගෙන යාමටද එය විශාල බාධාවක්ව පවතින බවද නිරීක්ෂණය විය. දේශීය හා විදේශීය වෙළඳ නියෝජිතයන් සමඟ අන්තර් සම්බන්ධතා පවත්වන නියාමන මධ්‍යස්ථානයක් වන මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පරිසරය ක්‍රමවත්ව සැලසුම් කර ගැනීම වෙනුවෙන් අවධානය යොමු කර නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 65 | 49 | 16 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | 0 |
| (iii) | ද්විතියික මට්ටම | 61 | 46 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 21 | 16 | 05 |
| | එකතුව | 149 | 113 | 36 |

(ආ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ කටයුතු සඳහා පහසුකම් සලසන ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුවේ කටයුතුවලදී වැදගත් වන පද්ධති විශ්ලේෂක තනතුර ඇති කළ දින සිටද, පුස්තකාලයාධිපති තනතුර 1999 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ අනුමත රියදුරු තනතුරු 06 ක් පැවතිය ද රියදුරු මහතුන් 04 දෙනෙක් පමණක් සේවයේ නිරත වේ. එහෙත් ආයතනය සතුව වාහන 08 ක් පවතින බැවින් රියදුරු තනතුරුවල පවතින පුරප්පාඩු හේතුවෙන් වාහන 04 ක් ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ නියුතු ඒකාබද්ධ සේවයට අයත් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 19 දෙනෙකු වසර 05 සිට වසර 32 දක්වා වූ කාල පරාසයක් ස්ථානමාරුවක් නොලබා මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටි බව නිරීක්ෂණය විය.